# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.29 පැය 0630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2134 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

**01. කොටහේන ප්‍රදේශයේ සිදු වූ වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.11.07 වන දින කොටහේන පොලිස් වසමේදී කාර් රථයකින් පැමිණි පුද්ගලයෙකු විසින් ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධය සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

ඒ අනුව විමර්ශන නිලධාරීන්ට ලද තොරතුරක් මත 2025.11.28 වන දින ජාඇල හා කොටහේන පොලිස් වසම් වලදී ඉහත මනුෂ්‍ය ඝාතනය සිදුකිරීමේ අපරාධයට පැමිණි සැකකරුවන්ට නවාතැන් පහසුකම් ලබාදී ආධාර අනුබල දීමේ වරදට සැකකරුවෙකු හා අපරාධය සිදුකිරීමෙන් පසු ගිනි අවිය ප්‍රවාහනය කිරීමෙන් ආධාර අනුබල ලබාදුන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් වයස අවුරුදු 21 හා 29 වයස්වල පසුවන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් පැය 72 ක රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - කින්නියා පොලිස් වසම.**

2025.11.28 වන දින අළුයම් කාලයේ කින්නියා පොලිස් වසමේ සමච්චතිවු ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට කින්නියා පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ සමච්චතිවු, කින්නියා ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සිය බිරිඳ හා දරුවා සමඟ නිවසේ නිදා සිටින අවස්ථාවේ නිවසට ඇතුළු වූ පුද්ගලයකු විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට සිදුකල විමර්ශනයේදි අනාවරණය වී ඇත. අපරාධය සිදුකළ සැකකරුවන් දෙදෙනෙකු ඝාතනය සඳහා යොදාගත් පොරවක් ද සමඟ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය කින්නියා රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කින්නියා පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මනුෂ්‍ය ඝාතනයක් - බද්දේගම පොලිස් වසම.**

2025.11.28 වන දින දහවල් කාලයේ බද්දේගම පොලිස් වසමේ ඉදුලහිටිය ප්‍රදේශයේදී කාන්තාවකට සිදුවූ පහරදීමක් හේතුවෙන් බද්දේගම රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බවට බද්දේගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 33 ක් වූ ඉදුලහිටිය, බද්දේගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය සහ සැමියා අතර ඇතිවූ පවුල් ආරවුලක් හේතුවෙන් සැමියා විසින් සිදුකළ පහරදීමකින් මෙම කාන්තාව මියගොස් ඇති බවට දැනට සිදුකල විමර්ශනයේදි අනාවරණය වී ඇත. අපරාධය සිදුකළ සැකකරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය බද්දේගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බද්දේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. දියේ ගිලී දරුවෙකු මියයාමක් - ඉඟිණියාගල පොලිස් වසම.

2025.11.28 වන දින සවස් කාලයේ ඉඟිණියාගල පොලිස් වසමේ නාමල්ඔය වැවේ දිය නෑමට ගිය දරුවෙකු දියේ ගිලී දරුවෙකු මියගොස් ඇති බවට ඉඟිණියාගල පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 14 ක් වූ නාමල්තලාව, අම්පාර ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මියගිය දරුවා තම ඥාතීන් පිරිසක් සමඟ නාමල්ඔය වැවේ දිය නෑමට ගොස් සිටියදී මෙලෙස දියේ ගිලී ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය ඉඟිණියාගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ඉඟිණියාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - වීරඹුගෙදර පොලිස් වසම.

2025.11.28 වන දින උදෑසන කාලයේ වීරඹුගෙදර පොලිස් වසමේ පඹේ රන්වලගෙදර මාර්ගයේ කළුඇලිය පාලම ආසන්නයේදී පඹේ හන්දිය දෙසට ධාවනය කල යතුරුපැදියක් මාර්ගයේ ලිස්සාගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු වීරඹුගෙදර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ අලුදෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වීරඹුගෙදර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වීරඹුගෙදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - ඉඟිණියාගල පොලිස් වසම.

2025.11.28 වන දින සවස් කාලයේ ඉඟිණියාගල පොලිස් වසමේ අම්පාර ඉඟිණියාගල මාර්ගයේ ඊතලය වංගුව ආසන්නයේදී අම්පාර දෙසට ධාවනය කල කාර් රථයක් මාර්ගයෙන් ඉවතට පැන සේනානායක සමුද්‍රයට පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් කාර් රථයේ රියදුරු හිමිනමක් සහ තවත් පුද්ගලයෙකු ප්‍රදේශවාසීන් විසින් ගොඩට ගෙන ඉඟිණියාගල රෝහලට ඇතුළත් කිරීමේදී එක් පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ පරගහකැලේ, අම්පාර ප්‍රදේශයේ පදිංචි යුධ හමුදා නිලධාරියෙකි.**

මෘත ශරීරය ඉඟිණියාගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඉඟිණියාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**